**කොළඹ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය,**

**ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2017/2018**

**PSC- 3265 - දේශපාලන භූගෝල විද්‍යාව**

**කාලය: පැ දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න

එක් ප්‍රශ්නයකට උපරිම **ලකුණු 20කි.**

---

1 (අ) දේශපාලන භූගෝල විද්‍යාව යන්න නිර්වචනය කරන්න.

(ආ) දහනම (19) වන සියවසෙහි අග භාගයේ සිට දේශපාලන භූගෝල විද්‍යාව වෙනම ශාස්ත්‍රීය විෂය ධාරාවක් ලෙස වර්ධනය වූ අයුරු සාකච්ඡා කරන්න.

2

(අ) ඓන්ද්‍රිය රාජ්‍යය පිළිබඳ සංකල්පයට (organic state) ෆෙඩ්රික් රැට්සල්ගෙන් ලැබුණු දායකත්වය පහදන්න.

(ආ) ඓන්ද්‍රිය රාජ්‍යය පිළිබඳ සංකල්පයට එරෙහිව එල්ල වූ ප්‍රධානම විවේචන මොනවා ද?

3

(අ) මැතිවරණ භූගෝල විද්‍යාවේ ප්‍රධාන අවධානය යොමුවන අධ්‍යයන ධාරා (study areas) කවරේ ද? ඒවායින් එකක් පිළිබඳ සවිස්තර ව පැහැදිලි කරන්න.

(ආ) මැතිවරණ භූගෝල විද්‍යාව තුළ පවතින ප්‍රාදේශීය සම්බන්ධතා මොඩලය (Areal Association Model) හා චර්යාවාදී මොඩලය (Behavioural Model) සසඳන්න.

4

(අ) භූගෝලීය සාධක ඡන්ද තීන්දුවට බලපෑම් කරන්නේ කෙසේ ද යන්න ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රතිඵල ආශ්‍රයෙන් පහදන්න.

(ආ) ශ්‍රී ලංකාවේ මැතිවරණ යතාර්ථයක් ආශ්‍රයෙන් 'මැතිවරණ භූගෝලීය පද්ධති මොඩලය' (Systems Model for Electoral Geography) විස්තර කරන්න.

( අ.පි.බ.)

5

(අ) සන්ධීයවාදය (Federalism) පිළිබඳ සංකල්පය පහදන්න.

(ආ) ලෝකයේ පවතින විවිධ සන්ධීය ක්‍රම (Federal systems) මොනවා ද? එම එක් එක් ක්‍රමයට උදාහරණ දක්වන්න.

(ඇ) සන්ධීයවාදය පිළිබඳ ලංකාවේ ඇති විවාදයෙහි (Federal debate) පරිණාමය සාකච්ඡා කරන්න.

6 (අ) ඓන්ද්‍රිය රාජ්‍යය පිළිබඳ සංකල්පය (organic state) මත පදනම්ව ෆ්‍රෙඩ්රික් රැට්සල් රාජ්‍ය ප්‍රසාරණය පිළිබඳ නීති 7ක් හඳුන්වා දුන්නේය. ඒවා සාකච්ඡා කරන්න.

(ආ) රැට්සල්ගේ 'ජීවත් වීමට ඇති ඉඩ' පිළිබඳ සංකල්පය (room to live) සාකච්ඡා කරන්න.

7 (අ) නූතන රාජ්‍යයන්ගේ සම්භවය සහ ප්‍රසාරණය කෙටියෙන් හඳුන්වන්න.

(ආ) ජාතික රාජ්‍යයන් අද වන විට මුහුණ දෙන ප්‍රධාන අභියෝග මොනවා ද? ශ්‍රී ලංකාවේ උදාහරණ ආශ්‍රයෙන් පහදන්න.

*****************